**ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

වාණිජ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තුමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණව හා නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයන් 03 ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 60 ක සිට සියයට 88 ක් දක්වා පරාසයකින් මුලු වටිනාකම රු. 976,961 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්ත වීම හේතුවෙන් පුහුණු වැඩසටහන්, විදේශ රටවල පැවැත්වීමට සැලසුම් කල වෙළෙඳ සාකච්ඡා, සමුළු, වැඩසටහන් අවලංගු වීම නිසා වැය විෂයයන්ගේ ඉතිරිවීම් ඇති වුණි.එසේම වැටුප සමඟ ගෙවනු ලබන ප්‍රවාහන දීමනා ඉල්ලුම් නොකිරීම හේතුවෙන් ප්‍රවාහන වියදම් වැය විෂයේ ඉතිරිවීම් ඇති වූ බව සඳහන් කරමි. | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්වත් පිළියෙල කළ යුතු වීම. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 1647(ඉ) | රෙගුලාසි ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනය 2022 වර්ෂය සඳහා සකස් කරන ලදි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයෙහි 06 ඡේදය | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත සඳහන් ආකෘතීන් මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර නොතිබුණි.<br>• සටහන (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය<br>• සටහන (ii) පොත් වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය<br>CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම සහ නව CIGAS වෙබ් යෙදුම් පද්ධතිය මඟින් ලබාගත් අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ | පාඩු හා අත්හැරීම් සහ පොත් වලින් කපා හැරීම් ආකෘතීන් 02 ද මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් කිරීමට සටහන් කරගත් බව සඳහන් කරමි.<br><br>මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ශේෂ පිරික්සුම (CIGAS යෙදුම මඟින් උත්පාදිත) හා අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන යන ආකෘතීන් ද ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සටහන් කර ගත් බවත් ඉදිරියේදී මෙවැනි ප්‍රමාද දෝෂ සිදුවීම වළක්වා ගැනීමටත් සටහන් කරගත් බව සඳහන් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6. ඡේදය | 2021 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2022 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2022 මැයි 10 දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය නියමිත දිනට පත්කර තිබුණද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ කටයුතු වල සිදු වූ යම් යම් ප්‍රමාදයන් හේතුවෙන් වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවේ ධාවන තත්ත්වයේ පවතින වාහන 07 ක් පැවති අතර ඉන් වාහන 04 ක චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | ප්‍රවාහන නිලධාරියා ස්ථාන මාරුවීම් ලැබුවද අනුප්‍රාප්තික නිලධාරියෙකු නොපැමිණීම හේතුවෙන් 2021 වර්ෂයේදී ඉන්ධන පරීක්ෂාව විධිමත් ලෙස සිදු කිරීමේ ප්‍රමාදයන් සිදු විය. 2022 වර්ෂයේදී මෙම කටයුත්ත ඉටු කිරීමට අපේක්ෂිතය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| 2.8.1(ආ) මාර්ගෝපදේශය | දෙපාර්තමේන්තුව ස්ථාපිත ගොඩනැගිල්ලෙහි කොටස් වෙන් කිරීම (Partition) සඳහා රු. 10,751,459 ක් වූ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් වූ තාක්ෂණික ඇගයීම් කමිටුව විෂය පිළිබඳ විශේෂඥයෙකුගෙන් සහ ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති එක් සාමාජිකයෙකුගෙන් සමන්විත විය යුතු වුවද එය වාණිජ අධ්‍යක්ෂවරයෙකු හා සහකාර වාණිජ අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සමන්විත වී තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම කොන්ත්‍රාත්තුවට අදාළ විෂය කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශයේ තාක්ෂණික නිලධාරීගෙන් උපදෙස් ලබා ගන්නා ලදී. මේ අනුව සවිස්තරාත්මක ප්‍රමාණ බිල්පත හා ඇස්තමේන්තු සැකසීම, පූර්ව - ලංසු සාකච්ඡා, සඳහා සහභාගී වී අවශ්‍ය උපදෙස් ලබාදීම, අමතර වැඩ සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙළඳපල මිල ගණන් හා සසඳා වාර්තා ලබා දීම යනාදී කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තාක්ෂණික නිලධාරී සම්බන්ධ කරගත් බව සඳහන් කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී " ගිණුමෙහි 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව අය විය යුතු ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව | 2006 වර්ෂයේ ගිණුම් සැසඳීමෙන් සොයාගත් ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම් සිදුකර ඇති අතර තවදුරටත් පවතින මෙම වෙනස සොයා ගැනීම සඳහා පසුගිය වර්ෂ වල ගිණුම් | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර වෙනස සැසඳීම් කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අය විය යුතු ශේෂයෙහි රු. 278,944 ක වෙනසක් පැවති අතර එම වෙනස වර්ෂ 15 කට අධික කාලයක සිට පැවත එමින් පැවතුණි. | සැසඳීම සිදුකරන අතර මෙම සියළු කටයුතු වල ප්‍රගතිය මත ඊළඟ වර්ෂ වල ගිණුම් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) | 2021 ජනවාරි 01 දිනට නිලධාරීන් 04 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ එකතුව රු. 60,319 ක ආපදා ණය ශේෂයන්ට අදාළ කිසිදු අය කිරීමක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | නිලධාරියෙකු සිංගප්පූරු මහ කොමසාරිස් කාර්යාලයේ හා නිලධාරීන් 3 දෙනෙකු බ්‍රසීල්, තුර්කි හා බැංකොක් තානාපති කාර්යාලවල සේවයට අනුයුක්තව සිටි කාලයේදී වැටුපෙන් අයකර ඇති ණය වාරික විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් වාණිජ දෙපාර්තමේන්තුවේ ගිණුමට බැර නොකිරීම මත අදාළ ණය ශේෂය යාවත්කාලීන කිරීමට නොහැකි වී ඇත. | හිඟ ණය ශේෂ විධිමත්ව අයකරගැනීමට හා අයකරගත් ණය වාරික නිවැරදිව පොත්වල සටහන් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | --------------------------------- |
| (අ) | ශ්‍රී ලංකාවේ ආනයන අපනයන තොරතුරු, තීරුබදු අනුපාත හා අනෙකුත් අදාළ සටහන් ලෝක වෙළඳ සංවිධානයේ ඒකාබද්ධ දත්ත පද්ධතිය සමඟ යාවත්කාලීන කිරීම දෙපාර්තමේන්තුව මඟින් කළ යුතු වුවද 2017 වර්ෂයෙන් පසු එම කාර්යය ඉටු කර නොතිබුණි. | 2019 ජුනි 04 දින සාකච්ඡාවේදී ශ්‍රී ලංකා රේගුව එකඟ වූයේ ලෝක වෙළඳ සංවිධානයට අවශ්‍ය ආකෘතියෙන් අදාළ දත්ත ලබාදීමටය. එහෙත් තවමත් අවශ්‍ය ආකෘතියෙන් අදාළ දත්ත ලබාදීමට ශ්‍රීලංකා රේගුව අපොහොසත් වී ඇත.මෙම තත්ත්වය දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ පරතරයට හේතු වී ඇත. | තොරතුරු යාවත්කාලීන කිරීමට සැලසුම්කරනු ලබන ක්‍රියාකාරකම් කාලීනව ඉටු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වසර 50 කට පෙර කාලයක සිට ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන සඳහා වන ආනයන තීරුබදු බැඳීම සියයට 50 ක් වන අතර එය සංවර්ධනය වෙමින් පවතින රටවලට සාපේක්ෂව පහළ අගයක් වන බැවින් විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණයක් සකස් කිරීමට සැලසුම් කර තිබුණද ලෝක වෙළඳ සංවිධානය සමඟ පවත්වන ලද සාකච්ඡාවන්හිදී ප්‍රගතියක් ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. | ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවල් රාශියක් (G 33 රටවල්)මෙම විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණය ඉල්ලා සිටී. එහෙත් සංවර්ධිත රටවල් රැසක් දිගින් දිගටම එයට අකමැත්ත පළකරමින් සිටී. එයට හේතුව වන්නේ ලෝක වෙළඳ සංවිධානයේ සාමාජික රටවල් (දැනට 164) සියල්ලෙහි එකඟතාවය හිමිවිය යුතු වීමයි. එබැවින් එම සාකච්ඡාවන්වල ප්‍රගතියක් ළඟා කර ගැනීම තනි රටක් වශයෙන් අපගේ පාලනයෙන් පිට පවතී. | විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණයක් සඳහා එකඟතාවය ලබාගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ඇ) | පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් ජාත්‍යන්තර වෙළඳාම තුළ වත්මන් සංවර්ධන අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීම සඳහා පර්යේෂණ කාර්යයන් 14 ක් ඉටු කිරීමට ඉලක්ක සකසා තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව ඉන් කාර්යයන් හතරක් පමණක් නිම කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි | සැලසුම්කල පරිදි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් මෝටර් රථයක් දුම් පරීක්ෂාව අසමත් වීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට නිෂ්කාර්යයව පැවති අතර එම වත්කම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රථය ක්‍රියාකාරී මට්ටමේ තිබුන ද දුම් පරීක්ෂාව අසමත් වීම් හේතුවෙන් නිෂ්කාර්යව පවතී. මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2019, 2020 හා 2021 වර්ෂයන්හී දී අලුත්වැඩියාවක් සිදුකළ නොහැකි විය. | අදාළ රථය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.3 අනාර්ථික ගනුදෙනු

--------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව මගින් මහජනතාවට සපයන සේවාවන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා 2019 වර්ෂයේ රු. 3,584,470 ක් වැය කර විද්‍යුත් පෝලිම් කළමණාකරණ ක්‍රමය හඳුන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට මෙම පද්ධතිය භාවිතයෙන් ඉවත් කර තිබුණි. | කොවිඩ් වෛරස් වසංගත තත්වයන්ට මුහුණ දීමේ අරමුණින් ප්‍රභවස්ථාන සහතිකපත් මාර්ග ගත ක්‍රමය යටතේ (online) නිකුත් කිරීමේ ව්‍යාපෘතියක් ජර්මානු රජයේ ආධාර යටතේ දැනට සිදුකරමින් පවතී. එහි පළමු අදියර 2022 ජූනි මාසයේ ආරම්භ කිරීමට නියමිතව ඇති බැවින් නැවත විද්‍යුත් පෝළිම් කළමණාකරන ක්‍රමයේ අවශ්‍යතාවයක් නොමැත.<br><br>කෙසේ නමුත් විද්‍යුත් පෝළිම් කළමණාකරන ක්‍රමය සඳහා මිලදී ගත් උපකරණ නව පරිගණකගත ක්‍රමයට යොදාගත හැක. | අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගෙන රාජ්‍ය මුදල් ආර්ථිකමය හා ඵලදායී ලෙස වැය කළ යුතු වීම. |

## 4. යහපාලනය

------------.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර විගණක පත් කිරීම**<br>-----------------------------------<br>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය හා 40 (2)(1) වගන්තිය ප්‍රකාර ගණන් දීමේ නිළධාරියා විසින් එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස සුදුසු විගණකවරයෙකු පත් කරනු ලැබිය යුතු වුවද පනතේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය දක්වාම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට එම තනතුර අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත මු.රෙ.**71** අයදුම්පත් ඉදිරිපත් කර තිබුණ ද රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත විටින් විට දෙපාර්තමේන්තුව විවිධ අමාත්‍යාංශයන් යටතට අනුයුක්ත කිරීම හේතුවෙන් අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වී ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 151 ලෙස දක්වා තිබුණද තථ්‍ය කාර්යය මණ්ඩලය 115 ක් වූයෙන් මුළු පුරප්පාඩු තනතුරු 36 ක් විය. එම පුරප්පාඩු අතරින් විධායක මට්ටමට අයත් ඉහළම තනතුරු දෙක වන වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුර හා අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් යන තනතුර ඇතුළත්ව විශේෂ හා පළමු ශ්‍රේණියේ අනුමත තනතුරු 10 න් තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුණි. | වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන තෙක් ලබා දී නොමැති අතර අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා දැනට සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් සිවුදෙනා සුදුසුකම් නොලබයි.එසේම වාණිජ අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් ලබා ඇති නිලධාරීනිය පත් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගෙන අදාල අනුමැතිය මත පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |